Lesson 36 **Question Words**

ක්වෙස්ශන් ව(ර්)ඩ්ස්

ප්‍රශ්න වචන

අපි මේ ඉගෙන ගන්න යන්නේ ඉතාම වැදගත් පාඩමක්. ප්‍රශ්න වචන කියන්නේ ඉංග්‍රීසි භාෂාවේ ඉතාම වැදගත් පද විශේෂයකට. ප්‍රශ්න වචන යොදාගෙන තමයි ඉංග්‍රීසි භාෂාවේ විවිද අර්ථයන් වල ප්‍රශ්න අසන්නේ. ප්‍රශ්න වචන නැතුව සහ ඒවා යෙදෙන විදිය දන්නේ නැතුව ඉංග්‍රීසි භාෂාව හසුරුවන්න අමාරුයි

ඉංග්‍රීසි භාෂාවේ මුලික ප්‍රශ්න වචන ටික තමයි මේ

what - වට් - මොකක්ද

why - වයි - ඇයි

when - වෙන් - කවදද / කීයටද ?

where - වෙයා(ර්) - කොහෙද ?

how - හව් - කොහොමද ?

who - හූ - කව්ද ?

which - විච් - කොයිකද ?

whose - හූස් - කාගේද ?

whom - හූම් - කාවද ?

How හැර අන් සියලුම වචන “wh” වලින් පටන් ගන්න නිසා මේ වචන වලට “wh” words කියලත් කියනවා .

ඉංග්‍රීසි භාෂාවේ මේ විදියේ ප්‍රශ්න වචනයක් යොදලා ප්‍රශ්නයක් හදන විශේෂ විදියක් තියෙනවා

- ප්‍රශ්න වචනයක් නිතරම් යෙදෙන්නේ වාක්‍යයේ ඉදිරියෙන්
- ඒ වගේම ප්‍රශ්න වචනයක් යෙදෙද්දී වාක්‍යය ප්‍රශ්නාර්ථ රූපයට හැරවෙනවා. ඒ කියන්නේ ප්‍රශ්න වචනයක් යොදන්න නම් ඒ වාක්‍යය ප්‍රශ්නාර්ථ රූපයෙන් තැබිය යුතුයි

උදාහරණයක් ගෙන බලමු

- ඔයා මොකටද කැමති ?

  ඔයා කැමතියි - You like , දැන් මේක ප්‍රශ්න ස්වරූපයට පෙරලිය යුතුයි

  Do you like ? - ඔයා කැමතිද ?

  දැන් මේකට ප්‍රශ්න වචනය එකතු කරමු

  what - මොකක්ද / කුමක්ද ?

  What do you like ?
  වට් ඩූ යූ ලයික් ?
  ඔයා මොකටද කැමති ?

ඊළගට මේ ප්‍රශ්නය ගොඩ නගමු

- කීයටද ඔයා යන්නේ ?

  ඔයා යනවා - you go - මෙය ප්‍රශ්නාර්ථ ස්වරූපයට පෙරලමු

  ඔයා යනවද ? - Do you go ?

  කීයටද - when

  When do you go ?
  වෙන් ඩූ යූ ගෝ ?
  කීයටද ඔයා යන්නේ ?

මේ උදාහරණයත් ගනිමු

- කොහෙද ඔවුන් ඉන්නේ ?

  ඔවුන් ඉන්නවා/ජීවත් වෙනවා - They live - මෙය ප්‍රශ්නාර්ථ ස්වරූපයට පෙරලමු

  ඔවුන් ඉන්නවද ? / ජීවත් වෙනවද ? – Do they live ?

  කොහෙද ? – where

Where do they live ?
වෙයා ඩු දේ ලිව් ?
ඔවුන් කොහෙද ඉන්නේ / ජීවත් වෙන්නෙ ?

හොදයි , අපි එකම ප්‍රශ්නෙකට වෙනස් ප්‍රශ්නාර්ථ වචන කිහිපයක් යොදා ප්‍රශ්න හදමු

අපිට පුළුවන් මේ ප්‍රශ්නය ගන්න - Do you go ? . දැන් එයට විවිධ ප්‍රශ්න වචන එක් කරමින් ප්‍රශ්න හදමු

- ඇයි ඔයා යන්නේ ?

  Why do you go ?
  වයි ඩු යූ ගෝ ?

- කොහෙද ඔයා යන්නේ ?

  Where do you go ?
  වෙයා(ර්) ඩු යූ ගෝ ?

- කොහොමද ඔයා යන්නේ ?

  How do you go ?
  හව් ඩූ යූ ගෝ ?

- කීයටද ඔයා යන්නේ ?

  When do you go ?
  වෙන් ඩූ යූ ගෝ ?

ඊළගට මේ ප්‍රශ්නය ගනිමු

- කොහෙද ඔයා ගියේ ?

ඔයා ගියා - you went - මෙය අතීත කල වාක්‍යයක්. මීලගට මෙය ප්‍රශ්නාර්ථ ස්වරූපයට පෙරලමු .

ඔයා ගියාද ?- Did you go ? (මෙය අතීත කාලයේ ප්‍රශ්නයක්. අතීත කාල ක්‍රියා වල ප්‍රශ්නාර්ථ රූපය ඔබට මතක තිබිය යුතුයි ? )

කොහෙද - where

Where did you go ?
වෙයා(ර්) ඩිඩ් යූ ගෝ ?
කොහෙද ඔයා ගියේ ?

- කීයටද ඔයා ගියේ ?

When did you go ?
වෙන් ඩිඩ් යූ ගෝ ?

- ඇයි ඔයා ගියේ ?

Why did you go ?
වයි ඩිඩ් යූ ගෝ ?

- කොහොමද ඔයා ගියේ ?

How did you go ?
හව් ඩිඩ් යූ ගෝ /

තවත් උදහරන් කිහිපයක් ගෙන බලමු .

- ඔයා මොනවද කරන්නේ (කරමින් ඉන්නේ ) ? (මෙය වර්තමාන සිදුවෙමින් පවතින ක්‍රියාවක ප්‍රශ්නයක් )

ඔයා කරමින් ඉන්නවා - you are doing
ඔයා කරමින් ඉන්නවද ? Are you doing ?

මොනවද - what

What are you doing ?
වට් ආ යූ ඩුයිං ?
මොනවද ඔයා කරන්නේ ?

- ඇය මොනවා කියයිද ? (මෙය අනාගත කාලයේ ප්‍රශ්නයක් )

ඇය කියාවි - She will say
ඇය කියාවිද ? - Will she say ?
මොනවා - what

What will she say ?
වට් විල් ෂී සේ ?
ඇය මොනවා කියාවිද ?

- ඇයි ඔයා මට කෝල් කලේ ?

ඔයා මට කෝල් කළා - You called me
ඔයා මට කෝල් කලාද ? - Did you call me ? (මෙය අතීත කාලයේ ප්‍රශ්නයක් )
ඇයි - why

Why did you call me ?
වයි ඩිඩ් යූ කෝල් මී ?
ඇයි ඔයා මට කෝල් කලේ ?

- කොහොමද ඔයා දන්නේ ?

ඔයා දන්නවා - You know
ඔයා දන්නවද ? - Do you know ?
කොහොමද ? - How

How do you know ?
හව් ඩූ යූ නෝ ?
ඔයා කොහොමද දන්නේ ?

- කොහෙදිද ඔයා ඔහුව දැක්කේ ?

ඔයා ඔහුව දැක්කා - You saw him
ඔයා ඔහුව දැක්කද ? - Did you see him (මෙය අතීත කාලයේ ප්‍රශ්නයක් )
කොහෙදිද ? - Where

Where did you see him ?
වෙයා(ර්) ඩිඩ් යූ සී හිම් ?

ඔයා කොහෙදිද ඔහුව දැක්කේ ?

- ඇය  මොනවද දවල් කෑමට උයලා තියෙන්නේ ?

ඇය  දවල් කෑමට උයලා තියෙනවා - She has cooked for lunch
ඇය  දවල් කෑමට උයල තියෙනවද ? - Has she cooked for lunch ? (මෙය කරලා තියෙන ක්‍රියා වල ප්‍රශ්න ස්වරූපය )
මොනවද - what

What has she cooked for lunch ?
වට්  හැස් ෂී  කුක්ඩ් ෆෝ ලන්ච් ?
මොනවද ඇය  දවල් කෑමට උයලා තියෙන්නේ ?

- ඕගොල්ලෝ මොනවද කරකර හිටියේ ? ( කරමින් හිටියේ ?)

ඕගොල්ලෝ කරකර හිටියා - You were  doing
ඕගොල්ලෝ කරකර හිටියද ? - Were  you  doing  ? (මෙය අතීත කාලයේ කරමින් සිටි ක්‍රියා වල ප්‍රශ්නය )
මොනවද - what

What  were  you  doing  ?
වට් ව(ර්)  යූ  ඩූයිං ?
මොනවද ඕගොල්ලෝ කරකර හිටියේ ?

- කොහෙද ඔහු ගිහින් තිබුනේ ?

ඔහු ගිහින් තිබුනා - He  had gone
ඔහු ගිහින් තිබුනද ? - Had  he gone  ? (මෙය කරලා තිබුණු ක්‍රියාවක ප්‍රශ්න රූපය )
කොහෙද - Where

Where  had  he  gone  ?
වෙයා(ර්) හැඩ් හී  ගෝන් ?
කොහෙද ඔහු ගිහින් තිබුනේ ?

හොදයි දැන් ඔබට  මේ ගැන යම් අවබෝධයක් ලැබෙන්න ඇති . මෙහිදී විශේෂයෙන්ම සදහන් කරන්න ඕන කාරණය තමයි අපි මේ වෙනකල් ඉගෙන ගෙන තියෙන ක්‍රියාවන් ප්‍රකාශ කරන සියලුම ආකාර වල (අපි මේ වෙනකොට එවැනි ආකාර  7ක් ඉගෙන ගෙන

තියෙනවා ) ප්‍රශ්නාර්ථ ස්වරූපය හැදෙන හැටි ගැන අවබෝධයක් තිබෙන්ට ඕන. නැත්නම් නිවැරදිව ප්‍රශ්නයක් ගොඩ නගා ගන්න අමාරුයි. ඒ වගේම ප්‍රශ්නයක් අහන්න ඕන වෙලාවට ඔය වගේ වාක්‍ය එහෙට මෙහෙට පෙරල පෙරලා ඉන්න පුළුවන් කමක් නැහැ. ක්ෂණිකව ඒ වාක්‍යය සාදා ගැනීමේ හැකියාවත් ඔබ වර්ධනය කරගන්න ඕන.ඒ හැකියාව තව ඉදිරියට භාෂාව අධ්‍යනය කරගෙන යනකොට සහ ඔබ ඔබේම වාක්‍යය තනා ගැනීමට උත්සහ දැරීමේදී ඉබේම මෙන් වර්ධනය වේවි

මීලගට , එක ප්‍රශ්න වචනයක් , එක අදහසක් ගෙන, අපි මෙතෙක් ඉගෙන ගත්තු ක්‍රියා ස්වරූප සියල්ලෙන්ම ඒ ප්‍රශ්නය අසන විදිය එක උදාහරණයකින් ගෙන බලමු . එවිට ඔබට ඒ ඒ ක්‍රියා ස්වරූපයන් වල ප්‍රශ්නාර්තය සෑදෙන විදියත් නැවත මතක් වේවි

what do you do ? - වට් ඩූ යූ ඩූ ? - ඔයා මොනවද කරන්නේ ?

What are you doing ? - වට් ආ යූ ඩුයිං ? - ඔයා මොනවද කරමින් ඉන්නේ ?

What did you do ? - වට් ඩිඩ් යූ ඩූ ? - ඔයා මොනවද කලේ ?

What have you done ? - වට් හැව් යූ ඩන් ? - ඔයා මොනවද කරලා තියෙන්නේ ?

What will you do ? - වට් විල් යූ ඩූ ? - ඔයා මොනව කරාවිද ?

What were you doing ? - වට් ව(ර්) යූ ඩුයිං ? - ඔයා මොනවද කරමින් හිටියේ ?

What had you done ? - වට් හැඩ් යූ ඩන් ? - ඔයා මොනවද කරලා තිබුනේ ?

ඊට අමතරව am ,is ,are වලින් එන වාක්‍යය , ඒ වගේම can වලින් එන වාක්‍යය , මේවයෙත් ප්‍රශ්නාර්ථ රූපය ඉදිරියෙන් තමයි ප්‍රශ්න වචනයක් යෙදෙන්නේ

මේ ප්‍රශ්නය ගන්න

ඇයි ඇයට කේන්ති ?

මුලින්ම ඇයට කේන්තියි කියන වාක්‍යය ගනිමු

She is angry
ෂී ඉස් ඇංග්‍රි
ඇයට කේන්තියි

එහි ප්‍රශ්නාර්ථ රූපය

Is she angry ?
ඉස් ෂී ඇංග්‍රි ?

ඇයි - why

දැන් වාක්‍යය තනමු

Why is she angry ?
වයි ඉස් ෂී ඇංග්‍රි ?
ඇයි ඇයට කේන්ති ?

Can වලින් එන වාක්‍යයක් ගනිමු

You can do
යූ කැන් ඩූ
ඔයාට කරන්න පුළුවන්

දැන් අපිට අහන්න ඕන “මොනවද ඔයාට කරන්න පුළුවන් ?” කියලා . ඉහත වාක්‍යය ප්‍රශ්න රූපයට හරවමු

Can you do ?
කැන් යූ ඩූ ?

දැන් ලේසියෙන්ම අර ප්‍රශ්නය හදන්න පුලුවන්

What can you do ?
වට් කැන් යූ ඩූ ?
මොනවද ඔයාට කරන්න පුළුවන් ?

හොදයි , ඉංග්‍රීසි භාෂාවේ ප්‍රශ්න වචන යොදලා වාක්‍යයක් හදන පිළිවෙල අපි දැන් ඉගෙන ගත්තා . ඊළඟ පාඩමේදී අපි ඒ එක් එක් ප්‍රශ්න වචනය අරගෙන ඒ එක් එක් ප්‍රශ්න වචනය යටතේ උදාහරණ වාක්‍යය අරගෙන බලමු

Lesson 36 **Spoken English**

මේ පාඩමේදී අපි ඉගෙන ගමු කඩේකින් බඩු ගන්න හැටි . ඔබට අවශ්‍ය යම් බඩුවක් තියෙනවද , ඒවායේ මිල ගණන් කොහොමද ආදිය විමසන හැටි . මේ දැනුම ඉතාම ප්‍රයෝජනවත් දැනුමක්

වෙළඳ සලකට ගිහිල්ල යමක් මිලට ගන්න විමසනවා නම් ඒ සදහා යොදා ගත හැකි හොද වාක්‍යයක් තමයි Do you have ……..?

- Do you have ……. ? ඩු යු හැව් ? - ඕගොල්ලෝ ලග තියෙනවද ?

අපි ඒ රටාවට වෙළඳ සැලකින් යම් යම් භාණ්ඩ තියෙනවද කියන විමසීම කරන විධිය බලමු

Do you have sugar ?
ඩු යූ හැව් ෂුග(ර්) ?
ඕගොල්ලෝ ළඟ සීනි තියෙනවද ?

Do you have phone cards ?
ඩු යූ හැව් ෆෝන් කාඩ්ස් ?
ඕගොල්ලෝ ළඟ ෆෝන් කාඩ්ස් තියෙනවද ?

Do you have any vegetables ?
ඩු යූ හැව් එනි වෙජිටබල්ස් ?
ඕගොල්ලෝ ළඟ එළවලු මොනවා හරි තියෙනවද ?
Do you have milk ?
ඩු යූ හැව් මිල්ක් ?
ඕගොල්ලෝ ළඟ කිරි තියෙනවද ?

Do you have rice flour
ඩු යූ හැව් රයිස් ෆ්ලව(ර්)
ඕගොල්ලෝ ළඟ හාල් පිටි තියෙනවද ?

Do you have bread ?
ඩු යූ හැව් බ්‍රෙඩ් ?
ඕගොල්ලෝ ළඟ පාන් තියෙනවද ?

Do you have yogurt ?
ඩූ යූ හැව් යෝගට් ?
ඕගොල්ලෝ ළඟ යෝගට් තියෙනවද ?

අපි බලමු කෙටි උදාහරණ සංවාද කීපයක් . ඒවායේ තිබෙනවා යම් දෙයක් තියෙනවද කියලා අහන හැටි , ඒ වගේම ඒවායේ මිල විමසන හැටි සහ අවසානයේ ඒ භාණ්ඩයේ තමන්ට අවශ්‍ය ප්‍රමාණය ඉල්ලන හැටි

Dialogue 1

A : Do you have sugar ?
ඩූ යූ හැව් ෂුග(ර්) ?
ඕගොල්ලෝ ළඟ සීනි තියෙනවද ?

B : Yes, we have sugar.
යස් , වි හැව් ෂුග(ර්)
ඔව් , අපි ලග සීනි තියෙනවා

A : How much is one kilo ?
හව් මච් ඉස් වන් කිලෝ ?
කිලෝ එකක් කීයද ?

B :It's 250 rupees per kilo
ඉට්ස් ටූ හන්ඩ්‍රඩ් ෆිෆ්ටි රුපීස් ප(ර්) කිලෝ
කිලෝ එක දෙසිය පනහයි

A : Please give me a kilo .
ප්ලීස් ගිව් මී අ කිලෝ
මට කිලෝ එකක් දෙන්න

Dialogue 2

A: Do you have any toothpaste?
ඩූ යූ හැව් එනී ටූත් පේස්ට් ?
ඕගොල්ලෝ ළඟ දත් බෙහෙත් තියෙනවද ?

B: Yes, we have.
යස් , වී හැව්
ඔව් , අපි ලග තියෙනවා

A: How much is it?
හව් මච් ඉසිට් ?
කීයද ?

B: A small one is 85 rupees
අ ස්මෝල් වන් ඉස් එයිටි ෆයිව් රුපීස්
පොඩි එකක් රුපියල් අසූ පහයි

A: Okay, give me a small one
ඕකේ ,ගිව් මී අ ස්මෝල් වන්
හරි , මට පොඩි එකක් දෙන්න

Dialogue 3

A: Do you have any milk?
ඩූ යූ හැව් එනි මිල්ක්
ඔගොල්ලෝ ළඟ කිරි තියෙනවද ?

B: Yes, we have milk
යස්, වී හැව් මිල්ක්
ඔව් , අපි ලග කිරි තියෙනවා

A: How much does it cost?
හව් මච් ඩස් ඉට්(ඩසිට් ) කොස්ට් ?
කීයද ගාන ? (යම් දෙයක ගාන අහන කොට මේ විදියත් ඉතාම හොඳ විදියක් ගාන අහන්න )

B: It’s 250 Rupees per 1 liter bottle
ඉට්ස් ටූ හන්ඩ්‍රඩ් ප(ර්) වන් ලීට(ර්) බොට්ල්
ලීටර් එකේ බෝතලයක් දෙසිය් පනහයි

A:I’ll take 2 bottles, please.
අයිල් ටේක් ටූ බොට්ල්ස් , ප්ලීස්
මම දෙකක් ගන්නවා (කරුණාකර මට දෙකක් දෙන්න )

Dialogue 4

A: Do you have any yogurt ?
ඩු යූ හැව් එනි යෝගට්
ඔගොල්ලෝ ළඟ යෝගට් තියෙනවද ?

B: Yes, we have two different kinds.Plain one and the flavoured one
යස් , වී හැව් ටූ ඩිෆරන්ට් කයින්ඩ්ස් . ප්ලේන් වන් ඇන්ඩ් ද ෆ්ලේව(ර්)ඩ් වන්
ඔව් , අපි ලග ජාති දෙකක් තියෙනවා , ප්ලේන් එකයි , රස කල එකයි

A: How much is the plain one?
හව් මච් ඉස් ද ප්ලේන් වන් ?
ප්ලේන් එක කීයද ?

B: It's 80 Rs .
ඉට්ස් එයිටි රුපීස්
රුපියල් අසුවයි

A: Okay, I'll take two.
ඕකේ , අයිල් ටේක් ටූ
හරි , මම දෙකක් ගන්නවා

Dialogue 5

A: Do you have rice flour?
ඩූ යූ හැව් රයිස් ෆ්ලව(ර්)
ඔගොල්ලෝ ලග හාල් පිටි තියෙනවා

B: Yes, we have it.
යස් , වී හැව් ඉට්
ඔව් , ඔව් , අපි ලග තියෙනවා

A: How much is it ?
හව් මච් ඉසිට් ?
කීයද ?

B: It's 200 Rs for a packet of 250g.
ඉට්ස් ටූ හන්ඩ්‍රඩ් ෆෝර පැකට් ඔෆ් ටූ හන්ඩ්‍රඩ් ෆිෆ්ටි ග්රෑම්ස්
ග්‍රෑම් දෙසිය පනහේ පැකට් එක රුපියල් දෙසීයයි

A: I'll take one packet.
අයිල් ටේක් වන් පැකට්
මම පැකට් එකක් ගන්නවා

අපි ඊලග පාඩමේදී තවත් කෙටි සංවාද කිහිපයක් ඉගෙන ගනිමු මේ ආකාරයට කඩේකින් බඩු මිලදී ගන්නා විදිය ගැන. එතෙක් මේ සංවාද හොදින් බලන්න , ඒ වගේම ඒවා හොදින් මතක උත්සාහ කරන්න

**Vocabulary 36**

Yogurt - යෝගට් - යෝගට්

sugar - ෂුග(ර්) - සීනි

toothpaste - ටූත්පේස්ට් - දත් බෙහෙත්

packet - පැකට් - පැකට්ටුව

milk - මිල්ක් - කිරි

plain - ප්ලේන් - සාමාන්‍ය , අමිශ්‍ර (මෙහි එන අදහස )

cost - කොස්ට් - මිල වෙනවා / මිල

flavour - ෆ්ලේව(ර්) - රසය

flavoured - ෆ්ලේව(ර්)ඩ් - රස කල

different - ඩිෆරන්ට් - වෙනස්

kind - කයින්ඩ් - වර්ගය

Flour - ෆ්ලව(ර්) - පිටි

Rice flour - රයිස් ෆ්ලව(ර්) - හාල් පිටි

Wheat flour - වීට් ෆ්ලව(ර්) - තිරිඟු පිටි (පාන් පිටි )

pillow – පිලෝ – කොට්ටය

pillow case - පිලෝ කේස්  - කොට්ට උරය

blanket – බ්ලැන්කට් – පොරවනය

stove – ස්ටෝ(ව්) – උදුන

gas stove - ගෑස් ස්ටෝ(ව්) - ගෑස් උදුන

plate – ප්ලේට් – පිගාන

cup – කප් – කෝප්පය

glass – ග්ලාස් – වීදුරුව

broom – බෲම් – කොස්ස